# 4 ශ්‍රේණිය පරිසරය

## 2021-5 ඒකකය

# අප පරිහරණය කරන දේ



අපට එදිනදා ජීවිතයේ විවිධ භාණ්ඩ හා උපකරණ පරිහරණය කිරීමට අවශ්‍ය වේ. ඒවා පෞද්ගලික මෙන් ම පොදු වශයෙන් ද පරිහරණය කෙරේ. එසේ පරිහරණය කිරීමේ දී ඒවායේ පිරිසිදුකම, ක්‍රමවත් බව, නිසි අයුරින් පරිහරණය සහ පවත්වා ගැනීම පිළිබඳ ව අවධානය යොමු කිරීම වැදගත් ය. එසේ පරිහරණය කිරීම පිළිබඳ ව මූලික හුරුව ලබා දීමට කටයුතු කිරීම මෙම තේමාවෙන් අපේක්ෂා කෙරේ. ඒ සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වෙමින් ඒ පිළිබඳ ව අත්දැකීම් ලබා දීම අවශ්‍ය වේ.


**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**

Online Class details – WhatsApp 071 - 9020298

# 5. තේමාව : අප පරිහරණය කරන දේ

අපට එදිනදා ජීවිතයේ විවිධ භාණ්ඩ හා උපකරණ පරිහරණය කිරීමට අවශ්‍ය වේ. ඒවා පෞද්ගලික මෙන් ම පොදු වශයෙන් ද පරිහරණය කෙරේ. එසේ පරිහරණය කිරීමේ දී ඒවායේ පිරිසිදුකම, ක්‍රමවත් බව, නිසි අයුරින් පරිහරණය සහ පවත්වා ගැනීම පිළිබඳ ව අවධානය යොමු කිරීම වැදගත් ය. එසේ පරිහරණය කිරීම පිළිබඳ ව මූලික හුරුව ලබා දීමට කටයුතු කිරීම මෙම තේමාවෙන් අපේක්ෂා කෙරේ. ඒ සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වෙමින් ඒ පිළිබඳ ව අත්දැකීම් ලබා දීම අවශ්‍ය වේ.

නිපුණතා :

- යම් කාර්යයක් සඳහා සුවිශේෂ භාණ්ඩ හා උපකරණ හඳුනා ගනිමින් ඒවා නිවැරදි ව, ක්‍රමානුකූල ව හා ආරක්ෂා සහිත ව පරිහරණය කරයි.
- උපකරණවල ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධයෙන් යුතු ව වඩාත් ඵලදායී ලෙස භාවිත කරයි.
- සම්පත්වලින් උපරිම ප්‍රයෝජනයක් ලැබෙන අයුරින් අරපිරිමැස්මෙන් යුතු ව භාවිත කරයි.
- අප පරිහරණය කරන භාණ්ඩයක් හෝ සේවාවක් හෝ ලබා ගැනීමේ දී හා සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ව අවධානයෙන් යුතු ව කටයුතු කරයි.
- එදිනෙදා පරිහරණය කරන දෑ වඩාත් ආකර්ෂණීය ලෙස සකස් කර ගැනීම සඳහා විවිධ නිර්මාණ කරයි.
- විවිධ උපකරණ පරිහරණය කරමින් ශක්ති වර්ධනයට උපකාරී වන ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
- අප පරිහරණය කරන දේ ඇසුරු කර ගනිමින් විවිධ ජන නැටුම්වල යෙදෙයි.

ඉගෙනුම් පල :

- තම සමීප පරිසරයේ විවිධ රැකියා සඳහා භාවිත කරන භාණ්ඩ හා උපකරණ හඳුනාගෙන නම් කරයි.
- එම උපකරණ භාවිත කරන ආකාරය පිළිබඳ තොරතුරු සොයා බලා වාර්තා කරයි.
- නිරන්තර පරිහරණයේ දී උපකරණවල නඩත්තුව පිළිබඳ ව විමසිලිමත් ව කටයුතු කරයි.
- භාණ්ඩයක් මිල දී ගැනීමේ දී ඊට අයත් ප්‍රමිතිය පිළිබඳ ව සැලකිලිමත් ව කටයුතු කරයි.
- බිලැත්තට්ටි මැස්ම හා දම්වැල් මැස්ම ඇසුරු කරගනිමින් එදිනෙදා පරිහරණයට අවශ්‍ය උපකරණයක් සකසා ගනියි.
- පරිහරණය කරන උපකරණ ඇසුරෙන් ව්‍යායාම කිරීමේ හා ඇල්ලීමේ ක්‍රීඩාවල නිරත වෙයි.
- අප පරිහරණය කරන උපකරණ ඇසුරෙන් ආදේශ භාණ්ඩ තනාගෙන නිර්මාණාත්මක සමූහ වාදනයේ යෙදෙයි.






4 වන ශ්‍රේණියේ සිසුන් වෙනුවෙන් සම්පාදනය කරන ලද සමාජ ඒකාබද්ධතා සංකල්ප සහිත ළමා කතා සංග්‍රහයෙහි "කුඩේට වුණු හදිය" කතාව මෙම තේමාව සඳහා යොදා ගන්න.

.පහත දී ඇති එක් එක් උපකරණ ඒ ඒ කර්මාන්ත අනුව වර්ග කර වගුවේ දක්වන්න.
(මේසන් හැන්ද,දඬු අඬුව, අතංගුව, නියන, උදැල්ල,මාදැල,ලඹය,කැත්ත,කිනිහිර
අතකොළුව,මයිනහම,හබල,සවල,රේක්කය,යතුකැටය)






| | පෙදරේරු කර්මාන්තය | ධීවර කර්මාන්තය | කම්මල් කර්මාන්තය | කෘෂි කර්මානත්ය | වඩු කර්මාන්තය |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |

**පහත දැක්වෙන්නේ විවිධ වෘත්තීන් සඳහා යොදා ගන්නා විවිධ භාණ්ඩ හා උපකරණයි. ඒවා හඳුනා ගන්න. නම් කරන්න.**





පෙදරේරු කර්මාන්තය






වඩු කර්මාන්තය






ධීවර කර්මාන්තය

මෝටර් රථ කර්මාන්තය






    

කෘෂි කර්මාන්තය

_______ _______ _______ _______ _______

විදුලි කර්මාන්තය

_______ _______ _______ _______ _______

**පහත දැක්වෙන උපකරණ භාවිත කරන අවස්ථා සොයා ලියන්න.**

උදා:

පෙදරේරු කර්මාන්තය

1. මනිස් ලෑල්ල - බිත්තියට යෙදූ බදාමය සුමට කර ගැනීමට.
2. ලෙවලය - බිත්තිය මට්ටම් කර ගැනීමට.

වඩු කර්මාන්තය

1. බුරුමය - ______________________
2. අත් කියත - ______________________

ධීවර කර්මාන්තය

1. අතංගුව - ______________________
2. බිලීපිත්ත - ______________________

පතල් කර්මාන්තය

1. ගැරුම් වට්ටිය - ______________________
2. ඉල්ලම්කූර - ______________________


කෘෂි කර්මාන්තය

1. උදැල්ල - ______________________
2. දෑකැත්ත - ______________________


කම්මල් කර්මාන්තය


1. මයිනහම - ______________________
2. කිණිහිර - ______________________

පහත දී ඇති රූප රාමුවල දැක්වෙන උපකරණ අනුව ඔවුන් කරන රැකියාව කුමක් දැ යි සොයා තිත් ඉරි මත ලියන්න.
























**පහත දැක්වෙන වෘත්තිකයන් සිය කටයුතු පහසුවෙන් කර ගැනීම සඳහා භාවිතා කරනු ලබන උපකරණ වගුව තුළ ලියා දක්වන්න.**

| වෘත්තිකයා | පරිහරණය කරනු ලබන භාණ්ඩ හා උපකරණ |
|---|---|
| 1. හෙදිය | |
| 2. ලිපිකරුවා | |
| 3. පරිගණක ශිල්පියා | |
| 4. කම්මල්කරුවා | |
| 5. වෙළෙන්ද | |

**පහත ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.**




හරහට:


1. කපරාදු බිත්තියක් සුමට කර ගැනීම සඳහා යොදා ගනියි.
2. සීසෑම සඳහා යොදා ගන්නා උපකරණය යි.
3. ලීවල කුඩා සිදුරු විද ගැනීමට භාවිත කරයි.


පහළට:


1. කම්මල් කර්මාන්තයේ දී භාවිත කරන උපකරණයකි.
4. ලී හා ලෝහ යොදා ගෙන නිපදවා ඇත.


**නිවසේ දී අප භාවිත කරන පහත භාණ්ඩ හා උපකරණ හඳුනා ගන්න. ඒවායින් ඇති ප්‍රයෝජන කොටුවෙන් තෝරා හිස්තැන් මත ලියන්න.**




| |
|---|
| අතුගෑම/ පැළීම/ ඇඹරීම/ පෙරීම/ කෙටීම/ පෙළීම/ කැපීම/ පීරීම/ මැසීම/ ඇඳුම් දැමීම/ ඇණ ගැසීම හා ගැලවීම/ විදුලිය තිබේ දැ යි පරීක්ෂා කිරීම/ වතුර උණු කිරීම/ ආහාර වර්ග දැමීම/ රෙදි මැදීම/ පිටි හැලීම |





______________






______________


______________


______________

**පහත දැක්වෙන එක් එක් විස්තරයෙන් කියැවෙන උපකරණයේ නම කොටුවෙන් තෝරා හිස්තැන මත ලියන්න. උපකරණය අයත් වන වෘත්තියේ නම ද ලියන්න.**

| |
|---|
| මේසන් හැන්ද/ උදැල්ල/ අත් කියත/ අතංගුව/ ගැරුම් වට්ටිය/ දැකැත්ත/ ස්පැනරය/ ටෙස්ටරය |

1. උපකරණ ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වේ. ඇල්ලීම සඳහා ලීවලින් සාදන ලද දිගු මිටක් දැකිය හැකි ය. කොටු හෝ දිගැටි හැඩැති ලෝහ තලයක් පවතී. එය පස් පිඩලි කපා වෙන් කිරීමට හැකි තියුණු මුවහතකින් යුක්ත වේ.
   a. උපකරණයේ නම : - ____________________
   b. උපකරණය භාවිත කරන වෘත්තීය :- ____________________

2. වේවැල්වලින් හෝ බට පතුරුවලින් නිම කර ඇති රවුම් හැඩැති උපකරණයකි. පස් සෝදා හැරීම සඳහා යොදා ගන්නා අතර සැහැල්ලු, භාවිතයට පහසු උපකරණයකි.
   a. උපකරණයේ නම : - ____________________
   b. උපකරණය භාවිත කරන වෘත්තීය :- ____________________

3. උපකරණය ලී හා ලෝහ යන අමුද්‍රව්‍ය දෙක ම භාවිත කර සාද තිබේ. ඇල්ලීම සඳහා කෙටි ලී මිටක් ඇත. ත්‍රිකෝණාකාර හැඩැති තලය ලෝහයෙන් නිම කර තිබේ.
   a. උපකරණයේ නම : - ______________________
   b. උපකරණය භාවිත කරන වෘත්තීය :- ______________________

**පහත අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට අපට සහය වන්නේ කවවිර වෘත්තිකයන් දැ යි කොටුවෙන් තෝරා හිස්තැන් මත ලියන්න.**

| | | | |
|---|---|---|---|
| වඩුවා | කම්මල්කරුවා | ගොවියා | වෛද්‍යවරයා |
| ධීවරයා | පතල්කරුවා | පෙදරේරුවා | විදුලි කාර්මිකයා |

1. උදලු තල හා පිහි තල සද ගැනීම සඳහා : ______________________
2. අල්මාරි, පුටු ඇතුළු ලී බඩු සාද ගැනීම සඳහා : ______________________
3. මාළු, කරවල අඩිය ලබා ගැනීම සඳහා : ______________________
4. සහල් සහ එළවළු ලබා ගැනීම සඳහා : ______________________
5. වටිනා මැණික් වර්ග ලබා ගැනීම සඳහා : ______________________
6. ගොඩනැගිලි සද ගැනීම සඳහා : ______________________
7. ලෙඩ රෝග සුව කර ගැනීම සඳහා : ______________________
8. විද්‍යුත් පරිපථ අලුත්වැඩියාව කර ගැනීම සඳහා : ______________________

**පහත විස්තර වලට ගැළපෙන උපකරණ ඇඳ දක්වන්න. නම් ලියන්න.**

පෙදරේරු කර්මාන්තයේ යොදු ගන්නා උපකරණයකි. කුඩා බෝතලයක් හැඩැති බරකට නූලක් ද එක් කරමින් සාද ඇත.

1. ______________________

මැහුම් කර්මාන්තයේ දී යොදු ගනී. එය ඇඟිල්ලේ පැළඳ ගැනීමෙන් ඉඳිකටුවෙන් හානියක් නොවී ආරක්ෂාව සැලසේ.

2. ______________________

වඩු කර්මාන්තයේ දී ලීවල කාදු කැපීමට හා කැටයම් කැපීම සඳහා භාවිත කෙරේ.

3. ______________________







පෙදරේරුවන් යොදු ගන්නා මෙය සුදු පාට ප්ලාස්ටික් බටයකි. එතුලින් ජලය දමා මට්ටම නිවැරදි ව බලා ගනී.

4. ______________________

ඉහත ආකාරයට ඔබ කැමති උපකරණයක රූපය කොටුව තුළ අඳින්න. අසා ඇති තොරතුරු සම්පූර්ණ කරන්න.

1. උපකරණයේ නම : ______________________________
2. විශේෂත්වය: : ______________________________
3. අයත් වන වෘත්තීය : : ______________________________
4. කෙරෙන කාර්යය : : ______________________________

**එක් එක් උපකරණවලින් කෙරෙන කාර්යය සොයා නිවැරදි ව යා කරන්න.**

| | | |
|---|---|---|
|  | 1. කම්බි කපා වෙන් කිරීම<br>2. පස් බුරුල් කිරීම<br>3. ලීය සුමට කිරීම<br>4. බිත්ති සුමට කිරීම<br>5. මාළු විශාල ප්‍රමාණයක් අල්ලාගත හැකි වීම<br>6. ඊයම් පෑස්සීම |  |
|  | |  |
|  | |  |

**පහත දැක්වෙන්නේ අනාරක්ෂිත ව උපකරණ නිසි ලෙස භාවිතා නොකළ අවස්ථා කිහිපයකි. එසේ වීම හේතුවෙන් සිදුවිය හැකි අනතුරු තිත් ඉරි මත ලියන්න.**

1. පාවහන් නොපැලඳ විදුලි උපකරණ භාවිත කිරීම : ______________________________
2. ඇස් ආවරණ භාවිත නොකර යකඩ වෑද්දුම් කිරීම : ______________________________
3. කතා බහ කරමින් කියතක් භාවිතයෙන් ලීයක් ඉරීම : ______________________________
4. වට පිට බලමින් ලීයක ඇණයක් ගැසීම : ______________________________
5. මුඛ ආවරණයක් නොමැති ව කුඹුරක තෙල් ඉසීම : ______________________________
6. බූට් සපත්තු නොමැති ව පාරට තාර දැමීම සිදු කිරීම : ______________________________
7. අත් මේස් නොමැති ව සිමෙන්ති භාවිත කිරීම : ______________________________
8. ටෙස්ටරයක් භාවිත නොකර විදුලිය තිබේදැ යි පරීක්ෂා කිරීමට යාම : ______________________________

**පහත දැක්වෙන එක් එක් හානිය අවම කර ගැනීම සඳහා භාවිත කල යුතු උපකරණය කොටුවෙන් තෝරා හිස්තැන් මත ලියන්න.**

| | | |
|---|---|---|
| කබා | හිස් වැසුම් | අත් මේස් |
| මුඛ ආවරණ | ආරක්ෂිත කණ්ණාඩි | බූට්ස් සපත්තු |

1. පාරේ රත් වූ තාර මත වැඩ කිරීමෙන් පාද පිච්චීමට ලක් වීම : ____________________
2. කුඹුරුවල තෙල් ඉසීමෙන් ශ්වසන අබාධවලට ලක් වීම : ____________________
3. විදුලිය පැස්සීමේ දී ඇස්වලට හානි සිදු වීම : ____________________
4. සෙමෙන්ති භාවිතයෙන් අත් පැලී යාම : ____________________
5. වාහන අලුත්වැඩියා කිරීමේ දී විවිධ උපකරණවලින් සීරීම් තුවාල සිදු වීම : ____________________
6. මාර්ගවල වැඩ කරන විට අධික හිරු රැස් නිසා හිසරදය ඇති වීම : ____________________

**පහත දී ඇති රූප ඇසුරෙන් වගුව සම්පූර්ණ කරන්න.**



| පෞද්ගලික ව පරිහරණය කරන උපකරණ | නිවසේ දී හා පාසලේ දී පොදුවේ පරිහරණය කරන උපකරණ |
| --- | --- |
| ______________________ | ______________________ |
| ______________________ | ______________________ |
| ______________________ | ______________________ |
| ______________________ | ______________________ |
| ______________________ | ______________________ |
| ______________________ | ______________________ |
| ______________________ | ______________________ |
| ______________________ | ______________________ |
| ______________________ | ______________________ |
| ______________________ | ______________________ |


**පහත සඳහන් භාණ්ඩ අප පෞද්ගලික ව පරිහරණය කළ යුත්තේ ඇයි? හිස්තැන් මත ලියන්න.**

උදා:

පනාව → හිස්හොරි ඇති වීම හා උකුණන් ඇති වීම වළක්වා ගැනීමට

1. දත්බුරුසුව → ______________________
2. තුවාය → ______________________
3. මේස් → ______________________
4. ලේන්සුව → ______________________
5. තොප්පිය → ______________________
6. බැනියම → ______________________


**පහත දැක්වෙන්නේ සේතුලිගේ නිවසෙහි තිබූ භාණ්ඩ ඇය විසින් වර්ගීකරණය කළ ආකාරය දැක්වෙන සටහනකි. එය හොඳින් නිරීක්ෂණය කරන්න.**




**පහත ද්‍රව්‍යවලින් නිපද වූ ඔබේ නිවසේ ඇති භාණ්ඩ හා උපකරණ ලියා දක්වන්න.**

| | |
|---|---|
| 1. මැටි | |
| 2. වේවැල් | |
| 3. වීදුරු | |
| 4. ප්ලාස්ටික් | |
| 5. දැව | |
| 6. යකඩ | |
| 7. රෙදි | |
| 8. රබර් | |

**පහත සඳහන් භාණ්ඩ/ උපකරණ පිළිබඳ විස්තර ද ඉහත ආකෘතියට අනුව තොරතුරු සපයන්න.**



භාණ්ඩයේ/ උපකරණයේ

1.නම : ________________

2.හැඩය : ________________

3. භාවිත කරන අකාරය : ________________

________________

4. නිසි පරිදි තැබිය යුතු ස්ථානය : ________

________________

5. අපිරිසිදු වන ස්ථානය : ________________

________________

6. අපිරිසිදු වීමට හේතු : ________________

________________


________________

7. අපිරිසිදු වීමට හැඩයේ බලපෑමක් තිබේ ද?

________________

8. පිරිසිදු කළ හැකි ක්‍රම: ________________

________________



භාණ්ඩයේ/ උපකරණයේ

1. නම : ________________

2. හැඩය : ________________

3. භාවිත කරන අකාරය : ________________

________________

4. නිසි පරිදි තැබිය යුතු ස්ථානය : ________

________________

5. අපිරිසිදු වන ස්ථානය : ________________

________________

6. අපිරිසිදු වීමට හේතු : ________________

________________


________________

7. අපිරිසිදු වීමට හැඩයේ බලපෑමක් තිබේ ද?

________________

8. පිරිසිදු කළ හැකි ක්‍රම: ________________

________________



භාණ්ඩයේ/ උපකරණයේ

1. නම : ________________

2. හැඩය : ________________

3. භාවිත කරන අකාරය : ________________

________________

4. නිසි පරිදි තැබිය යුතු ස්ථානය : ________

________________

5. අපිරිසිදු වන ස්ථානය : ________________

________________

6. අපිරිසිදු වීමට හේතු : ________________

________________


________________

7. අපිරිසිදු වීමට හැඩයේ බලපෑමක් තිබේ ද?

________________

8. පිරිසිදු කළ හැකි ක්‍රම: ________________

________________



භාණ්ඩයේ/ උපකරණයේ

1. නම : ________________

2. හැඩය : ________________

3. භාවිත කරන අකාරය : ________________

________________

4. නිසි පරිදි තැබිය යුතු ස්ථානය : ________

________________

5. අපිරිසිදු වන ස්ථානය : ________________

________________

6. අපිරිසිදු වීමට හේතු : ________________

________________

________________

7. අපිරිසිදු වීමට හැඩයේ බලපෑමක් තිබේ ද?

________________

8. පිරිසිදු කළ හැකි ක්‍රම: ________________

________________


**පොදුවේ භාවිත කරන භාණ්ඩ කිහිපයක් නිවැරදි ව පරිහරණය කිරීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග කිහිපයක් පහත දැක්වේ. ඒවා කියවන්න.**

කුඩය




වර්ශාවක දී භාවිත කළ පසු තෙත වියළී යන තෙක් එළිමහනේ විවෘත කර තැබීම

ගෑස් ලිප




භාවිතයෙන් පසු හොඳින් පිසදා පිරිසිදු කර තැබීම

හැන්ද



භාවිතයෙන් පසු සබන් හෝ වෙනත් පිරිසිදු කාරකයක් යොදා සෝදා ගැනීම.

විදුලි පංකාව




මකුළු දැල් ආදිය බැඳුණු ස්ථාන දූවිලි පිසිනයක් මඟින් ඉවත් කර හොඳින් පිසදා පිරිසිදු කිරීම.

**පහත සඳහන් දෑ නිවැරදි ව පරිහරණය කිරීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග කිහිපයක් ලියන්න.**

1. කේතලය




2. බ්ලෙන්ඩරය



3. සපත්තු




4. තුවාය



**පරිහරණය කරන සෑම භාණ්ඩය ම නිසි පරිදි පිරිසිදු කිරීම, පිළිවෙලකට තැබීම හා නඩත්තු කිරීමෙන් ඔබට සැලසෙන වාසි හිස්තැන් මත ලියන්න.**

1. ______________________________
2. ______________________________
3. ______________________________
4. ______________________________
5. ______________________________

**පහත දැක්වෙන්නේ ජනිඳුගේ නිවසේ මුළුතැන්ගෙයි භාණ්ඩ හා උපකරණ තබා ඇති ආකාරය යි. එසේ වීමට හේතුවෙන් ඔවුන්ට අත්වන අවාසි ලියන්න.**



______________________________
______________________________
______________________________
______________________________
______________________________
______________________________
______________________________
______________________________
______________________________

**භාණ්ඩ හා උපකරණ නිසියාකාර ව නඩත්තු කිරීම පිණිස ඔබ විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග කොටුවෙන් තෝරා හිස්තැන් මත ලියන්න.**


1. අහාර ගැනීමෙන් පසු පිඟානේ ඉඳුල් තැවරී තිබෙන විට : ______________
2. මේස, පුටුවල කකුල් කැඩී බිඳී ගිය විට : ______________
3. තිර රෙදි, ඇඳුම් ආදිය ඉරී ගිය විට : ______________
4. කප්පිවල කොටස් ගෙවී ඇති විට : ______________
5. මැෂින් ක්‍රියාත්මක නොවන විට : ______________

| | | |
|---|---|---|
| A - අමතර කොටස් දමා නැවත සකස් කිරීම | | B - ලිහිසි තෙල් යෙදීම |
| C - දිනපතා පිරිසිදු කිරීම | D - මැසීම | E - අලුතින් ලී යොදා සකස් කිරීම |

පහත වගන්ති නිවැරදි නම් "✓" ලකුණද වැරදි නම් "X" ලකුණද වරහන් තුළ යොදන්න.

1. උපකරණ නිවැරදි ව පරිහරණය කිරීමෙන් අනතුරු අවම කර ගත හැකි ය. ( )
2. භාණ්ඩ හා උපකරණ වැරදි ලෙස පරිහරණය කිරීමෙන් ඒවා දිගු කාලයක් භාවිත කළ හැකි ය.( )
3. තමාගේ කකුලට ප්‍රමාණවත් නොවන සපත්තු පැලඳීමෙන් සමබර ව ඇවිදීමට හැකි වේ. ( )
4. කැඩී බිඳී ගිය ලී බඩු නැවත පිළිසකර නොකොට භාවිතයෙන් ඉවත් කිරීම කළ යුතු ය. ( )
5. උපකරණ නිවැරදි භාවිතයෙන් මුදල් ඉතිරි වේ. ( )

**පහත දැක්වෙන භාණ්ඩ නිවැරදි ව පරිහරණය කරන ආකාරය බැගින් ලියන්න.**




______________________________

______________________________




______________________________

______________________________



______________________________

______________________________



______________________________

______________________________

**පාවහන් භාවිතය සම්බන්ධයෙන් පහත අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ලියන්න.**

1. ගෙතුළට පිවිසෙන විට ඔබ, ඔබගේ පාවහන් ගලවා තබන්නේ කොහි ද? ______________________
2. ඔබගේ පාවහන් පිරිසිදු කිරීමට ඔබ භාවිතා කරන ක්‍රමයක් ලියන්න.


   ______________________________________________________________
3. පාවහන් භාවිතයේ දී වැරදි ක්‍රම අනුගමනය කිරීමෙන් ඔබ මුහුණ දෙන ගැටලු මොනවා ද?

   ______________________________________________________________


   ______________________________________________________________
4. පාවහන් පැලඳ ඇවිදීමේ දී වැරදි ඉරියවු පවවිත්වා ගැනීම නිසා ඇති විය හැකි අබාධ මොනවා ද?

   ______________________________________________________________

නිවැරදි ව ගමන් කර ඇති පා සටහන් පේළිය තෝරා අදාළ කොටුව තුළ “✓” ලකුණ යොදන්න.



☐



☐



☐

**වෙළෙඳ පොලෙන් මිල දී ගත් ඕනෑම භාණ්ඩයක ඇසුරුමක් ලබා ගන්න. එය පහත කොටුව තුළ ඇඳ දක්වන්න.**

ඔබ විසින් සම්පූර්ණ කරන ලද ඉහත ඇසුරුම ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. කල් ඉකුත් වීමේ දිනයක් තිබේ ද? ____________________________________________
2. තිබේ නම්, එම දිනය කවදා ද? ____________________________________________
3. ඇසුරුමක කල් ඉකුත් වීමේ දිනයක් ඇතුළත් කිරීමේ ඇති වැදගත්කම කුමක් ද?

   ____________________________________________
4. නිෂ්පාදිත දිනයක් තිබේ ද? තිබේ නම්, එම දිනය කවදා ද? ______________________
5. ප්‍රමිති සලකුණ තිබේ ද? (SLS/ ISO) ______________________

## ප්‍රමිති සලකුණු

ප්‍රමිති සලකුණු යනු, භාණ්ඩයේ තත්ත්වය පිළිබඳ වැටහීමක් ලබා දීමට උපකාරී වන සලකුණු යි . මේවා භාණ්ඩ අලෙවිකරුට මෙන් ම භාණ්ඩ මිලට ගන්නා පාරිභෝගිකයන්ට අතිශය වැදගත් ය.

**SLS යනු කුමක් ද?**

ඇතැම් භාණ්ඩවල ඇසුරුමේ SLS යන ඉංග්‍රීසි අකුරු මුද්‍රණය වී තිබේ. මෙහි අක්ෂර සිය භාණ්ඩ ලේබලයේ ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා ගත යුතු වේ.

එනම්, මෙම සහතිකය නිකුත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (Sri Lanka Standards Institute) නම් වූ ආයතනය මගිනි. මෙම අක්ෂර භාවිතයට නිෂ්පාදකයාට අවසර දීමට පෙර එම ආයතනය අදාළ නිෂ්පාදනවල තත්වයය පරීක්ෂා කර බලනු ඇත.

එහිදී අදාළ නිෂ්පාදනවල අමුද්‍රව්‍ය සාම්පල හා අවසාන නිෂ්පාදන පරීක්ෂා කරනු ලැබේ. ඉන්පසු භාණ්ඩයේ තත්ත්වය ඉහළ නම්, SLS ලාංඡනය භාවිතයට අවසර ලබා දේ.

ඇතැම් භාණ්ඩ හා සේවා සඳහා ISO සහතිකය පිරිනැමේ. මෙම සහතිකය ලබා දීමේ දී පෙර මෙන් භාණ්ඩය පරීක්ෂා කිරීමක් සිදු නොකෙරේ.

නිෂ්පාදනය හෝ සේවා සපයන ආයතනයේ භාණ්ඩ හා සේවා සැපයුම් ක්‍රියාවලිය පිළිවෙලකට අදියරෙන් අදියර සිදුවේ දැ යි පරීක්ෂා කෙරෙනු ඇත. ඉන්පසු අදාළ ප්‍රමිතිය ඇති බව ප්‍රකාශයට පත් කෙරේ.

ඒ අනුව මෙහි දී ලබා දෙන්නේ පද්ධති සහතිකයකි.


**පහත දී ඇති ඇසුරුමෙහි ඊතල මගින් දක්වා ඇති ස්ථාන හඳුන්වන නම කොටුව තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.**

| |
|---|
| අඩංගු ද්‍රව්‍ය/ මිල/ කල් ඉකුත්වීමේ දිනය/ තත්ත්ව සහතික/ වෙළෙඳ නාමය/ අඩංගු පෝෂ්‍ය පදර්ථ ශුද්ධ බර/ නිෂ්පාදකයාගේ ලිපිනය/ වෙළෙඳ ලකුණ/ භාවිතයට උපදෙස් |




**එදිනෙදා පරිහරණයට අවශ්‍ය උපකරණ සකසා ගැනීමට උපකාරී වන මැහුම් ක්‍රම හඳුනාගනිමු.**

බ්ලැන්කට් මැස්ම



රෙදිවල, ඇඳුම්වල වාට් අද්දර නිම කිරීම සඳහා මෙම මැහුම් ක්‍රමය භාවිත වේ.
වර්ණ කිහිපයක නූල් යොදා මෙය විසිතුරු මැස්මක් ලෙස ද යොදා ගනී.

දම්වැල් මැස්ම



රේඛාවන් මැසීමට, මල්, කොළ වැනි දෑ පිරවීම සඳහාත් මෙම මැස්ම යොදා ගනී.
අලංකාරය සඳහා යොදා ගත හැකි මැහුම් ක්‍රමයකි.


**මැහුම් ක්‍රම භාවිතා කර ලේන්සුවක් නිර්මාණය කරමු.**


*දෙමව්පියනි, ලේන්සුව නිර්මාණය කිරීම සඳහා දරුවන්ට සහාය වන්න. ඉඳිකටුව ආරක්ෂාකාරීව හැසිරවීමට ඔවුන්ට උපදෙස් ලබා දෙන්න.*

අවශ්‍ය ද්‍රව්‍ය:


- සෙ. මී. 30x30 පමණ ප්‍රමාණයේ තනි ළා පැහැ වර්ණ කපු රෙද්දක්.
- සෙ. මී. 5 ප්‍රමාණයේ ඉඳිකටුවක්
- තද පාට වර්ණ කිහිපයකින් යුතු නූල්.


- ❖ නූල සෙ.මී 30 කට වඩා වැඩි නොවන සේ දෙපොට දමා ගන්න.
- ❖ රූප සටහනේ පෙනෙන පරිදි රෙදි කැබැල්ල සෙ.මී. 1 ක ප්‍රමාණයේ වටේ ම නවා ගන්න.
- ❖ ඉඳිකටුව උඩට යටට යවමින් වටේ ම නූල් දුවවන්න.
- ❖ බ්ලැන්කට් මැස්මෙන් වටේ මහන්න.
- ❖ දී ඇති ආකාරයේ පුංචි මලක් ලේන්සුව අගින් ඇඳ ගන්න.






- ❖ ඒ වටා දම්වැල් මැස්මෙන් ළඟ ළඟ නූල් යවා මල්, නටුව හා පත්‍රය වටේ මැසීමට දරුවන් යොමු කරවන්න.





ක්‍රියාකාරකම

- පන්ති කාමරයේ සියලු සිසුන් එළිමහන් ස්ථානයකට කැඳවාගෙන ගොස් රවුමක් ආකාරයට අත් දිගහැර සිටගෙන සිටීමට පවසන්න.
- ඉන් පසු 1, 2, 1, 2 වශයෙන් ගණන් කිරීමට සලස්වා 1 පළමු කණ්ඩායම සහ 2 වන කණ්ඩායම වශයෙන් එකම රවුම තුළ කණ්ඩායම් දෙකක් සකස් කර කණ්ඩායම් දෙකේ ම නායකයන් දෙදෙනකු පත් කර ගන්න.
- එම නායකයින් දෙදෙනා ද එකම ස්ථානයේ සිටුවා විශාල ප්‍රමාණයේ පන්දු 02ක් නායකයන්ට ලබා දෙන්න.
- ගුරුවරයාගේ සංඥාවට අනුව පන්දුව දෙපැත්තෙන් වටේ සිටින තමාගේ යහළුවා අතට විසි කරමින් (රවුමේ යවමින්) කණ්ඩායම් දෙකේ නායකයා අතට ඉක්මනින් පන්දුව එවන කණ්ඩායමට ජයග්‍රහණය අත් වේ.
- තව දුරටත් සිසුන් ක්‍රීඩාවේ නිරත කරවන්න.
- එක් වටයක් තමාගේ කණ්ඩායමට අයත් පන්දුව වටේ ගොස් ආ විට ලකුණු 1ක් ලෙස සැලකේ.
- තරඟ ආරම්භ කිරීමට පෙර ලකුණු 03 හෝ 04ක් ලබා ගන්නා කණ්ඩායමට ජයග්‍රහණය හිමි වන බව පවසන්න.
- ඒ අනුව එම ලකුණු 03ක් හෝ 04ක් ලබා ගැනීමට කටයුතු කරනු ඇත.
- එම සංඛ්‍යාව පළමුව ලබා ගත් කණ්ඩායම ජයග්‍රහණය කරනු ඇත.




ක්‍රියාකාරකම

- අප පරිහරණය කරන අපතේ යන දේවල් කිහිපයක් රැස් කර ගන්න. (එක් අයකුට එක බැගින් වන පරිදි)

  උදා : හැඳි, පොල්කටු, ටින්, බෙලෙක්ක, කාබන් පෑන්, බෝතල් (වීදුරු/ප්ලාස්ටික්), ටොනික් බෝතල් මූඩි, . . .

- සෑම භාණ්ඩයක් ම හොඳින් සෝදා පිරිසිදු කරගන්න.
- රැස් කරගත් උපකරණවල මුවහත් බව අඩු කරගන්න.

  උදා : ටින්, බෙලෙක්ක, ටොනික් මූඩි, . . . ආදියේ

- ඉන් පසු ටින් දෙකක් එකට බැඳ ආදේශ තම්මැට්ටමක්, පොල්කටු/තාච්චි පියන්වලින් ආදේශ තාලම්පට, මූඩිවලින් පන්තේරුවක්, ලොකු ටින් එකකින් බෙරයක් ආදි වශයෙන් උපකරණ සකස් කරගන්න. බෙර වාදනය කිරීම සඳහා කඩිප්පුවක් (කෝටුවක්) සාදා ගන්න.
- එම උපකරණ මනා නිමාවකින් යුතු ව සකස් කර ගැනීමට සැලකිලිමත් වන්න.
- තනාගත් ආදේශ භාණ්ඩවල ශබ්දය හොඳින් අසන්න. හඬ වැඩි භාණ්ඩ ඇත් නම් ඒවා අඩුවෙන් ද, හඬ අඩු භාණ්ඩ ඇත්නම් ඒවා වැඩියෙන් ද වන පරිදි වාදනය කිරීමට උපදෙස් දෙන්න.

- ඒ ඇසුරෙන් වැස්සක්/කර්මාන්ත ශාලාවක්/කෝච්චියක්, . . . ආදියෙහි හඬ අනුකරණය කරමින් වාදනය කිරීමට සිසුන් යොමු කරන්න.
- වාදනයේ දී විනය වැදගත් බව සිසුන්ට පෙන්වා දී සිසුන් අත ඇති භාණ්ඩ අවශ්‍ය විට පමණක් වාදනය කිරීමෙන් නිකුත් වන වන හඬේ මධුරතාව හා පැහැදිලි බව දිස්වෙන ආකාරයත් සාකච්ඡා කරන්න.
- සිසුන් අතර භාණ්ඩ හුවමාරු කරමින් විවිධ නිර්මාණාත්මක සමූහ වාදන සහිත ව රංගන ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- සිසු ඉදිරිපත් කිරීම් අගය කරන්න.

01. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

i. ගෙතුළට පිවිසෙන විට පාවහන් නිසි පරිදි ගළවා ඇතුල්වීමෙන් වළක්වා ගත හැකි රෝගයකි.

i. ඩෙංගු ii. කොරෝනා iii. දියවැඩියාව iv. අධිරුධිර පීඩනය

ii. නිවැරදිව ඇවිදින විට පළමුවෙන්ම පොළොවේ ස්පර්ෂ විය යුත්තේ,

i. පාදයේ ඇඟිලි ii. පතුල iii. විලුඹ iv. මුළු පාදයම

iii. පාවහන් මිලදී ගැනීමේදී අප විසින් මිලදී ගත් යුත්තේ,

i. පාදයේ ප්‍රමාණයට සරිලන
ii. පාදයේ ප්‍රමාණයට වඩා වැඩි
iii. පාදයේ ප්‍රමාණයට වඩා අඩු පාවහන්ය

iv. ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය සංකේතවත් වන්නේ,

i. ISO ii. SSL iii. LSS iv. SLS

v. ටොනික් මූඩි වලින් සෑදිය හැකි ආදේශන සංගීත භාණ්ඩයකි

i. තාලම්පට ii. තම්මැට්ටම iii. පන්තේරුව iv. බෙරය

vi. භාණ්ඩයන් මිලට ගැනීමේදී වඩාත්ම සැලකිලිමත් විය යුතු කරුණ වන්නේ,

i. භාණ්ඩය නිෂ්පාදකයාගේ නම
ii. භාණ්ඩයේ අලංකාර බව
iii. භාණ්ඩයේ විශාලත්වය
iv. භාණ්ඩය නිෂ්පාදිත දිනය හා කල් ඉකුත්වීමේ දිනය

- පෙදරේරු කර්මාන්තයේ භාවිතා වන උපකරණ කිහිපයක්.

